කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
கொழும்புப் பல்கலைக்கழகம், இலங்கை
**UNIVERSITY OF COLOMBO, SRI LANKA**

අපේ අංකය / Our Ref. No. :
ඔබේ අංකය / Your Ref. No. :

2021.02.05

සියලුම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්,
සියලුම විශ්වවිද්‍යාල සේවක මහත්ම මහත්මීන් වෙත.

**<u>කොවිඩ් 19 වසංගතය හමුවේ විශ්වවිද්‍යාලයීය කටයුතු පවත්වාගෙන යාම</u>**

ලෝකයේ බොහෝ රටවල ගෝලීය වසංගතයක් ලෙස සීඝ්‍රයෙන් පැතිරීයන කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම රෝගීන් සංඛ්‍යාව ගෝලීය වශයෙන් සීඝ්‍ර ඉහලයාමක් පෙන්නුම් කෙරේ. මෙම වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 රෝගීන්ගේ සීඝ්‍ර වර්ධනයක් ඇති පසුබිමක කොළඹ විශ්වවිද්‍යාලය තුලින් මෑතක සිට වාර්තා වන රෝගීන්ද පළමුපෙල සහ දෙවනපෙල ආශ්‍රිතයන්ගේද යම් ඉහල යෑමක් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් මෙම වසංගතය හමුවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආනාගත අභිවෘද්ධිය සාක්ෂාත් කිරීම සඳහා සිසුන්ගේ අඩපණ වී ගිය අධ්‍යයන කටයුතු මෙන්ම විභාග රජයේ සෞඛ්‍ය උපදෙස් වලට අනුව ඉක්මනින් පවත්වා රටට වැඩදායක කුසලතාවලින් සපිරි උපාධිධාරීන් ජාතියට දායාද කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කඩිනම් වැඩ පිලිවෙලක් සකස් කොට ඇත.

මෙවන් අවස්ථාවක කොවිඩ් වසංගතයට අප විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය හා සේවක ප්‍රජාවට ශක්තිමත්ව මුහුණ දීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

නව ජීවන රටාවක් සහ අඛණ්ඩ උසස් අධ්‍යාපනයක් පවත්වා ගැනීම ඔබ අප සැමගේ සාමූහික වගකීමක් වනු ඇත.

01. වහාම කියාත්මකවන පරිදි ශිෂ්‍ය හා සේවක නිරෝධායන කටයුතු සඳහා බොරලැස්ගමුව නේවාසිකාගාරය වෙන් කිරීමට තීරණය කර ඇති අතර, ආසාදියන්ගේ පළමු පෙල හා දෙවන පෙල ආශ්‍රිතයන් තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කලහොත් මෙම නේවාසිකාගාර පහසුකම් පුළුල් කිරීමට විශ්වවිද්‍යාල පරිපාලනය කටයුතු කරනු ඇත.
02. විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිපාදන භාවිතා කරමින් ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණයන් (Rapid Antigen Test for Covid 19) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරීතුමන්ගේ නිර්දේශයන්ට අනුව කඩිනමින් සිදු කිරීමට කටයුතු සලසා ඇත.
03. විශ්වවිද්‍යාලය පරිශ්‍රය තුළ කොවිඩ් 19 රෝග ලක්ෂණ පෙන්නුම් කරණ ආසාදිතයකු වාර්තා වුව හොත්, 1990 ක්ෂණික ගිලන්රථ සේවාව වෛද්‍ය නිලධාරීන්ගේ උපදෙස් හා ඉල්ලීම මත අදාල සේවය ලබාගත හැක. ඒ සඳහා ඔබට අදාල පීඨයේ පරිපාලන නිලධාරීන්, පීඨාධිපති, ශිෂ්‍ය අනුශාසකවරුන් දැනුවත් කර එම සේවාව ඔබ වෙනුවෙන් සම්බන්ධීකරණය කර ගත හැක.
04. ඔබ පීඨයේ හෝ ඔබ අංශයේ කොවිඩ් 19 ආසාදිත බවට තහවුරු වූ රෝගියකු හෝ රෝගියකුගේ ආශ්‍රිතයකු වාර්තා වුවහොත් එම පුද්ගලයන් පිලිබඳ විස්තර පීඨාධිපතිතුමා, අංශ ප්‍රධානීන් හා විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී වෙත දැන්විය යුතුය.
05. අවදානම් තක්සේරුවෙන් පසු නිරෝධායනයට ලක්වීමට උපදෙස් ලැබෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ සේවක මහත්ම මහත්මීන් තම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින් නිකුත් කරනු ලබන නිරෝධායන සහතිකය නැවත සේවයට වාර්තා කරන විට ඉදිරිපත් කල යුතුය.
06. විශ්වවිද්‍යාලය මගින් තවදුරටත් ඔබගේ සෞඛ්‍ය තත්වය මනාව පවත්වාගෙන යාම සඳහා විශබීජ නාශක දියර සහ සබන් සහ දෑත් සේදීමට අදාල පහසුකම් පවත්වාගෙන යනු ලැබේ. මෙම සියලු සේවාවන් සම්බන්යෙන් ගැටලුවක් පවතී නම් අදාල පීඨයේ හෝ පරිශ්‍රයේ/නේවාසිකාගාරයේ පරිපාලන නිළධාරීන්, උපශාලාධිපතිවරුන් හෝ විනයාරක්ෂක නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගත යුතුය.
07. සියලුම සෞඛ්‍ය උපදෙස් පිලිපදිමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ සේවකයන්ගේ සෞඛ්‍ය තත්වය ආරක්ෂා කර ගැනීම සියලු දෙනාගේම සමූහික වගකීමක් වනු ඇත.
08. කොවිඩ් 19 සම්බන්ධයෙන් ඕනෑම ගැටලුවක් සඳහා කරුණු පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් විශ්වවිද්‍යාල මහජන සෞඛ්‍ය පරීක්ෂක ඇමතීමට ලබා දී ඇති දුරකථන අංක භාවිතා කල හැක. (0715371519/0715371510)

මේ පිලිබඳ අදහස් යෝජනා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /සාමාන්‍ය පාලන අංශය (prasannasar@ga.cmb.ac.lk) හෝ සහකාර ලේඛකාධිකාරී /ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය (ar@ssa.cmb.ac.lk) වෙත විද්‍යුත් තැපැල මගින් යොමුකල හැක.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන් විජේරත්න
උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය

තැපැල් පෙට්ටි අංකය 1490, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 3, ශ්‍රී ලංකාව P.O. Box No. 1490, Cumaratunga Munidasa Mawatha, Colombo 3, Sri Lanka
தபாற்பெட்டி இல.1490, குமாரதுங்க முனிதாச மாவத்த, கொழும்பு 3. இலங்கை.

දුරකථන අංක : / தொலைபேசி இல: / Telephone Nos :

| | | | | |
|---|---|---|---|---|
| Vice-Chancellor | : 2583810 | Fax : 2586059 | E-mail | : vc@cmb.ac.lk |
| Registrar | : 2583818 | Fax : 2553188 | E-mail | : registrar@cmb.ac.lk |
| Bursar | : 2586652 | Fax : 2586652 | E-mail | : bursar@cmb.ac.lk |
| General | : 2581835, 2584695, 2585509 | | | |